''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
Online ISSN: 2394-6792
http://fhss.sjp.ac.lk/pumithiri-journal/
වෙළුම: 2; II කලාපය; 2023 නොවැම්බර්; පිටු: 45-50

# ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා පවුල් සංස්ථාව තුළ කාන්තාව

**බුද්ධික මිතුල කුමානායක**
අපරාධවිද්‍යා හා අපරාධ යුක්තිය පිළිබඳ උපාධිධාරී, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
buddhikamithula@gmail.com

**සංක්ෂේපය**
විවිධ මුහුණුවරයන් තුළින් ස්ත්‍රිය හා පුරුෂයා දෙස බලන සමාජමය දෘෂ්ටිකෝණය පදනම්ව ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ ස්ත්‍රියට හා පුරුෂයාට ඇති සමාජ තත්වයන් නිර්මාණය වී තිබේ. එලෙස සමාජය විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ගොඩනගා ගත් විවිධ තත්ත්වයන් හා මතවාදයන් සමාජයේ සෑම ස්ථරයකම දැකගත හැකි වන අතර, අධ්‍යාපන, ආගමික, ආර්ථික හා දේශපාලන යන සමාජ සංස්ථාවල මෙන්ම සමාජයේ කුඩාම ඒකකය වන පවුල් සංස්ථාව තුළින්ද ඒ බව මනාව පිළිබිඹු වේ. පවුල් සංස්ථාව තුළ කාන්තාව පීඩාවට හා වින්දිතභාවයට පත්වන බව සියලු දෙනා දන්නා කරුණක් වුවත් එය සියලු දෙනාම සමාජයෙන් සඟවන සාධකයක් ලෙස පෙන්වා දිය හැකිය. පවුල් පසුබිම් තුළ ඇතිවණු ලබන ඇතැම් ගැටලු හේතුවෙන් කාන්තාව සමාජ ගැරහුමට ලක්වීම, ස්වාමියා හා බිරිඳ එකසේ තම දායකත්වය සිය පවුල වෙත ලබා දිය යුතු වුවද ඇතැම් අවස්ථාවන් තුළදී බිරිඳ බහු කාර්යයන් සිදුකිරීම, ඇතැම් සමාජ ක්‍රමයන් හා උපසංස්කෘතීන් තුළ දැකගත හැකි අඩු වයස් විවාහ හා සෘජුවම පවුල තුළ කාන්තාවගේ ස්වාධීනත්වයට බලපෑම් ඇති කිරීම ආදිය සමාජය තුළ බහුලව දැක ගත හැකිවේ. පවුලක් තුළ කාන්තාව විවිධ භූමිකාවන් ඉටු කරනු ලබන අතර ළමා කාලයේදී, තරුණ කාලයේදී මෙන්ම විවාහ වී බිරිඳක් හා මවක් ලෙස භූමිකාවන් ඉටු කිරීමේ දී ද විවිධ ආකාරයේ අසාධාරණයන්ට ලක්වනු ඇත. නමුත් පවුල් සංස්ථාව තුළ ප්‍රධානතම හා වගකිවයුතු භූමිකාවක් කාන්තාව විසින් සිදු කරනු ලබන අතර ඇය එකම අවස්ථාවක මවකගේල බිරිඳකගේල දියණියකගේ හා සහෝදරියකගේ කාර්යයන් ඉටු කරනු ලබයි. එනම් පවුලක සමබරතාවය පවත්වා ගැනීමේ වගකීම් සහගත භූමිකාව එම පවුල තුළ බිරිඳ හෝ මව විසින් සිදු කරනු ලබයි. ඒ අනුව පුරුෂ කේන්ද්‍රීය සමාජ ක්‍රමයක කාන්තාවට පවුල් සංස්ථාව තුළ කෙතරම් බලපෑමක් ඇති වුවද පවුල් සංස්ථාවේ පැවැත්ම සඳහා ඇයගේ භූමිකාව අත්‍යවශ්‍ය වේ.

**මූඛ්‍ය පද:** පවුල් සංස්ථාව, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සමාජය, සංස්කෘතිය

## හැඳින්වීම

මිනිසා පිළිබඳව සමාජ කියවීම අනේකවිද තේමාවන් ඔස්සේ සාකච්චාවට බඳුන්කළ හැකි අතර ස්ත්‍රී - පුරුෂ වශයෙන් බෙදා වෙන්කිරීම එහි සාකච්චාවට ලක් කළ හැකි එක් ප්‍රධානතම තේමාවක් වේ. එනම් එය විවිධ විෂය පරාසයන් හා සමාජීය හා මනෝභාවාත්මක මතවාදයන් මත ගොඩනැගී ඇති පුළුල් පරාසයක් වන බැවිනි. මෙලෙස ස්ත්‍රී පුරුෂ ලෙස බෙදා වෙන් කිරීම ජීව විද්‍යාත්මක සාධක මත පදනම්ව සිදුකර තිබෙන අතර එය ලිංගභේදය යන සාධකය මත ගොඩනගා තිබේ. මෙය මිනිසාට මෙන්ම තිරිසන් සතුන්ට ද පොදු කරුණක් වනු ලබයි. නමුත් ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන යථෝක්ත තේමාව හා බැදෙන සාධකය පදනම් වී ඇත්තේ මිනිසා කේන්ද්‍රකර කරගනිමින් මිනිසා විසින් නිර්මාණය කරගත් මනෝභාවාත්මක හා සමාජීය තත්ත්වයන් මත පදනම්ව වේ. එමෙන්ම පෙන්වා දිය යුතු වැදගත්ම කරුණ වනුයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය නිර්මාණය වීමෙහිලා බලපෑ ඇති සුවිශේෂීම කරුණු වනුයේ ස්ත්‍රී පුරුෂ වශයෙන් ජීව විද්‍යාත්මක කරුණු මත පදනම්ව බෙදා වෙන් කිරීම වේ. එනම් ලිංගිකත්වය මත පදනම්ව සමාජය විසින් දීර්ඝ කාලයක් තිස්සේම මෙම ස්ත්‍රියට හා පුරුෂයාට සමාජය තුළ වෙන් වෙන් වශයෙන් තත්වයන් ආරෝපණය කිරීම සිදුකරනු ලබයි. එහිදී සංස්කෘතික වශයෙන්, සමාජීය වශයෙන් මෙන්ම ආගමික, දේශපාලනික, සිරිත් විරිත්, ජාති, කුල, ඇදහිලි හා සමාජ සම්බන්ධතා ආදී විවිධ මුහුණුවරයන් තුළින් මෙම ස්ත්‍රිය හා පුරුෂයා දෙස බැලීම සමාජය විසින් සිදු කරනු ලබන අතර ඒ මත පදනම්ව ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ ස්ත්‍රියට හා පුරුෂයාට ඇති සමාජ තත්ත්වයන්

නිර්මාණය වී තිබේ. ඒ අනුව මෙම සමාජ තත්ත්වය ස්ත්‍රී පුරුෂ ලිංගභේදය මෙන් ස්ථාවරව පෙන්වාදිය හැකි දෙයක් නොවන අතර සංස්කෘතියෙන් සංස්කෘතියට, සමාජයෙන් සමාජයට ගතික වනු ලබයි. එනම් නාගරික සංස්කෘතියක් තුළ පවතින ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ මතවාදයන්ට වඩා ග්‍රාමීය සංස්කෘතියක් තුළ පවතිනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ වූ මතවාදයන් වෙනස් අගයක් ගනු ලබයි.

මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණු වනු වනුයේ මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ පුරුෂයාට වඩා ස්ත්‍රීන්ට අඩු තත්ත්වයක් සමාජය විසින්ම නිර්මාණය කර තිබීම වේ. එනම් බමුණු සමාජ තුළ සිටම ස්ත්‍රිය පහත් කොට සැලකීමත් පුරුෂයා ස්ත්‍රියට වඩා බලසම්පන හා ප්‍රබලයකු ලෙස සැලකීමත් සමාජයේ මුල් බැසගෙන ඇති මතවාදයක් ලෙස පෙන්වා දිය හැක. හැකියාවන්, මානසික මට්ටම, එඩිතරකම, තීරණ ගැනීමේ හැකියාව, නායකත්ව ලක්ෂණ, තාර්කික හැකියාව හා පෞරුෂය ආදී විවිධ හේතු සාධක මුල් කර ගනිමින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ පුරුෂයාට වඩා පහත් කෝණයකින් ස්ත්‍රිය දෙස බැලීම සමාජය විසින් සිදුකරනු ලබයි. එමෙන්ම ස්ත්‍රීය ලාමක, පුරුෂයා මත යැපෙන, පුරුෂයාගේ ආරක්ෂාව යටතේ සිටින හා දරුවන් පෝෂණය කිරීම, රැක බලා ගැනීම මෙන්ම ගේ දොර හා දරුවන්ගේ කටයුතු සිදු කිරීම යන කාර්යයන් තුළ කොටු වී සිටින චරිතයක් බවට පෙන්වා දී තිබේ. ඒ තුළින් පෙන්වා දී ඇත්තේ ස්වභාවයෙන්ම ස්ත්‍රියට හෝ පුරුෂයාට හිමිවී ඇති කාර්යය භාරයන් වන අතර දරුවන් බිහි කිරීමේ කාර්යය ද එහි ප්‍රධාන තැනක් ගනු ලබයි. ඒ අනුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කර ගනිමින් මෙලෙස ගොඩනැගී ඇති මතවාදයන් සෑම සමාජයක් තුලම එනම් දියුණු සමාජ ක්‍රමයන්, දියුණු රාජ්‍යයන් තුළ පවා දැකගත හැකි බව මෙහිදී පෙන්වා දිය යුතු වේ.

මෙලෙස සමාජය විසින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ගොඩනඟා ගත් තත්ත්වයන් හා මතවාදයන් සමාජයේ සෑම ස්ථරයකම පවතිනු ලබන අතර අධ්‍යාපන, ආගමික, ආර්ථික, දේශපාලන යන සමාජ සංස්ථාවල මෙන්ම සමාජයේ පහළම ඒකකය වන පවුල් සංස්ථාව තුළ දී ද දැකගත හැකි වේ.

**පවුල හා සමාජ තත්ත්වයන්**

යථෝක්ත දැක්වූ ආකාරයට සමාජය තුළ පවතිනු ලබන කුඩා ම ඒකකය වනුයේ පවුල වේ. එනම් මිනිසා කේන්ද්‍ර කරගත් සමාජය ගොඩ ගොඩනැගීම ආරම්භ වනු ලබන්නේ පවුල තුළින් වේ. ජීව විද්‍යාත්මක සාධකයන් මත පදනම්ව බිහි වනු ලබන දරුවා සමාජානුයෝජනය ක්‍රියාවලියේ මූලික පියවර තබනු ලබන්නේ පවුල තුළින් වේ. ඒ අනුව පවුල් සංස්ථාව යනු සමාජ සංස්ථාවන්ගේ විශාල කාර්යභාරයක් සිදු කරනු ලබන ඒකකයක් බව මනාව පැහැදිලි වනු ලබයි. එම්.එෆ්.නිම්කොෆ් (M. F. NImcoff) විසින් දක්වා ඇති ආකාරයට පවුලක් යනු වැඩි කාලයක් හෝ අඩු කාලයක් පවතින දරුවන් ඇතිව හෝ නැතිව භාර්යාව හා ස්වාමි පුරුෂයා එක්වූ ඒකකයක් වේ. එමෙන්ම විවාහයෙන්, රුධිරයෙන් හෝ නීත්‍යානුකූලව බැඳී එකම නිවසක ජීවත් වෙමින්, එකිනෙකා අන්තර් සම්බන්ධතා පවත්වමින්, එකිනෙකාට උරුම වූ තත්ත්වයන්ට නියමිත කාර්යභාරයන් ඉටු කරමින් පොදු සංස්කෘතියකට යටත්ව ජීවත් වීම පවුලක් වන බව බර්ග් සහ ලොක්ස් (Burgess and Locke) විසින් පෙන්වා දී තිබේ. එමෙන්ම එලියට් සහ මෙරිල් (Eliot and Merrill) විසින් පෙන්වා දී ඇත්තේ ස්වාමිපුරුෂයා, භාර්යාව හා දරුවන් ඇතුළත් ජීව විද්‍යාත්මක ඒකකය පවුලක් වන බවයි. මෙහිදී පවුල පිළිබඳව දක්වන ලද නිර්වචනයන්ට අනුව එහි පොදු ලක්ෂණයක් දැකගත හැකි වේ.

එනම් පවුලක් නිර්මාණය වීම සඳහා බලපානු ලබන ප්‍රධානතම චරිතයක් ලෙස ස්වාමි පුරුෂයා මෙන්ම භාර්යාවද පෙන්වා දී ඇති බවයි. ඒ අනුව අන්තර් ලිංගික සම්බන්ධතාවයන් පවත්වා ගෙන යාමටත්, පරම්පරාව ගොඩනගා ගැනීමටත්, සමාජය තුළ පවුල ඉදිරියට ගෙන යාමට මෙන්ම පවුලක් ලෙස පරිපූර්ණ වීම සඳහාද පවුල් සංස්ථාව තුළ බිරිඳකගේ හා මවගේ භූමිකාවන් ඇතුළත් විය යුතු බව මෙහිදී පැහැදිලි වේ. මෙකී වූ පවුල් සංස්ථාව වර්ගීකරණයට ලක්කළ හැකි අතර එහිදී විවාහය මත පවුල් වර්ගීකරණය, නිවස මත පවුල් වර්ගීකරණය, පරම්පරාව හෝ පෙළපත පදනම් කරගෙන සිදුවන විවාහ මත පවුල් වර්ගීකරණය, බලය තිබීමේ ස්වභාවය පදනම් කරගත් පවුල් වර්ගීකරණය, ප්‍රමාණය එසේත් නැතිනම් ආකෘතිය පදනම් කරගත් පවුල් වර්ගීකරණය හා ඥාතීත්වයේ ස්වභාවය මත ඇතිවන පවුල් වර්ගීකරණයය ආදී වශයෙන් පෙන්වා දිය හැක. එමෙන්ම මෙකී හඳුනාගත් පවුල තුළ දැකගත ගත හැකි පොදු ලක්ෂණ කිහිපයක් පවතිනු ලබන අතර පොදු වාසය, ආර්ථික සහයෝගීතාවය, ප්‍රජනනය හා අධ්‍යාපනය මෙහි ප්‍රධාන තැනක් ගනු ලබයි. එකී වූ කාර්යයන් සිදු කෙරෙහිලා ප්‍රධානතම දායකත්වයක්

දෙනු ලබන්නේ පවුලක් තුළ ස්වාමියා හා බිරිඳ වේ. එනම් පවුල් සංස්ථාව තුළ ප්‍රධාන ජීවනාලිය වනු ලබන්නේ ස්ත්‍රිය හා පුරුෂයා එනම් ස්වාමියා හා බිරිඳ වේ. එකී වූ පවුල මත ස්වාමියා හා බිරිඳ සඳහා වෙන් වෙන් වූ සමාජ තත්ත්වයන් මෙන්ම සමාජ කාර්යභාරයන් ද පවතිනු ලබන අතර එම සාධකයන් මත පවුල් සංස්ථාව තුළද ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ මතවාදයන් ගොඩනැඟීම සමාජය තුළින්ම සිදු වී ඇත. එහිදී පවුල් සංස්ථාවක ස්ත්‍රියට හා පුරුෂයාට හිමිවන තත්ත්වයන් හා කාර්යයන් ද වෙන වෙනම ඔවුන්ට ආරෝපණය කර ඇති අතර එම පසුබිම තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන කරුණ ඉස්මතු වනු ලබයි.

අතීත නොදියුණු සමාජයක ක්‍රමයන් තුළ දී මෙන්ම දියුණු සමාජ ක්‍රමයන් තුළ ද පවතිනු ලබන තත්ත්වයක් වනුයේ පවුල් තුළ පුරුෂයාට වඩා අඩු ප්‍රතිරූපයක් ස්ත්‍රියට නිර්මාණය කර තිබීමයි. විවිධ කුල හා ජාති මෙන්ම ආගම් ආදී සාධකයන් මත මෙන්ම සිරිත් විරිත් ආදිය හේතුවෙන්ද පවුල් සංස්ථාව තුළ පුරුෂයාට වඩා පහත් තත්ත්වයක් ස්ත්‍රියට හිමි වී තිබේ. එනම් ඇතැම් උප සංස්කෘතීන් තුළ දැකගත හැකිවනුයේ පවුලක ගැහැණු දරුවෙකු ඉපදීම අසුබ නිමිත්තක් බවත් පිරිමි දරුවෙකු පවුලට වාසනාව ගෙනඑන කරුනක් බවත් වේ. එනම් පවුලක පෙළපත ගෙන යාම සිදුකළ හැක්කේ පිරිමි දරුවකුට පමණක් වන බවත් දේපළ, ඉඩකඩම් ආදී තත්වයන් තුලදී ද එය විශාල වාසි සහගත තත්ත්වයක් බවත් මෙහිදී පැවත එන මතවාදයන් වේ. ගැහැණු දරුවෙකු පවුල සිටීම එම පවුලට මහත් වගකීමක් බවත් විශාල කාර්යයන් රාශියක් ඒ සඳහා කළ යුතු වන බවත්, පිරිමි දරුවකු පවුලකට එවැනි වූ බරක් නොවන බවත් ඔවුන් විසින් සලකනු ලබයි. ඒ අනුව පවුල තුළ ජීව විද්‍යාත්මකව ගැහැණු දරුවෙකු හා පිරිමි දරුවෙකු ඉපදීම යන කාරණාව තුළම ස්ත්‍රී පුරුෂ සමාජභාවය යන සාධකය මතු වී ඇති බව මොනවට පැහැදිලි වේ.

පුරුෂ කේන්ද්‍රීය සමාජයක පවුලක් තුළ ගනු ලබන තීන්දු තීරණ ගැනීමේ ප්‍රධාන බලධාරියා වනු ලබන්නේ එම පවුලේ ස්වාමියා වේ. එනම් පවුල තුළ බොහෝ අවස්ථාවල දී වැදගත් තීන්දු තීරණ ගනු ලබන්නේ පවුලක පියා හෝ වැඩිමහල් සොහොයුරා වනු ලබන අතර ඒ තත්ත්වය තුළ ද ස්ත්‍රිය පහත හෙළීමක් සිදුකර තිබේ. එනම් ඇතැම් කාර්යයන් සඳහා ඔවුන්ගේ අවසරය ලබා ගැනීමට ද සිදු වනු ලබන අතර හුදෙක් ඔවුන්ගේ තීන්දු තීරණ මත ක්‍රියා කිරීමට භාර්යාවට හා අනිකුත් ස්ත්‍රී සාමාජිකයන්ට සිදු වනු ලබයි. එමෙන්ම විවිධ අවස්ථාවන් නියෝජනය කිරීමේදී ද තම පවුලේ නියෝජිතයා ලෙස පත් වනු ලබන්නේ පියා වන අතර ඒ තුළින් පවුලේ තත්ත්වය හා ගරුත්වය විදහාපෑමට කටයුතු කරනු ලබයි. ඒ අනුව පෙනීයනු ලබන්නේ පවුලක ප්‍රධාන භූමිකාව පුරුෂයාට නැතිනම් ස්වාමියාට හිමිවන අතර කාන්තාවට එහි අඩු තැනක් ඇති බවයි.

**අපරාධ විද්‍යාත්මක විවරණය**

එමෙන්ම අපරාධ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයට අනුව දැක්වීමේ දී විවිධ අතෝරයන්ට ලක් වීමට ද කාන්තාවට සිදු වනු ලබයි. එනම් පවුල් සංස්ථාව තුළ ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ආදී තත්ත්වයන්හිදී කාන්තාව වැඩි වශයෙන් වින්දිතභාවයට පත්වීම සිදු වනු ලබයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් පුරුෂ කේන්ද්‍රීය සමාජ ක්‍රමයක් තුළ මෙලෙස කාන්තාවන් පවුල තුළ වින්දිතභාවයට පත් වීම සුලබව දැකිය හැකි කරුණක් වේ. පුරුෂයාගේ මානසික හිංසනය මෙන්ම කායික හිංසනය ආදී වූ විවිධ පීඩාවන්ට ලක්වීමටත් කාන්තාවන්ට ඇතැම් පවුල් සංස්ථාවන් තුළ සිදු වනු ලබයි. එහිදී ඇතැම් කාන්තාවන් තමන්ගේ පවුලට සිදුවිය හැකි අපකීර්තිය ගැන සැලකිල්ලට ගනිමින් තමන්ට සිදුවනු ලබන අසාධාරණයන් හා අපරාධයන් නීතිය හමුවේ ඉදිරිපත් නොකිරීම සිදුකරනු ලබන අතර එය තව තවත් විඳ දරා ගනිමින් පවුලේ ගරුත්වය ආරක්ෂා කර ගැනීමට කටයුතු කරනු ලබයි. මෙය යමුනා මාලනී පෙරේරා නම් කිවිඳිය විසින් "කුලී මාලිගාව" නම් පද්‍ය සංග්‍රහයෙහි එන "සුරා සොඬ සැමි වලප" නම් පද්‍ය පන්තිය තුළින් පෙන්වා දී ඇත. මේ අත් දනී දුන් හටි බැට නිමක් නැතී - මේ මුව දනී දුන් නොසරුප් බැනුම් වැසී, වද වද මගෙම පරපුර හොඳ හිතින් දරා - ලැබ ලැබ කටුක දුක් ගිනි නැගුනි බුර බුරා - විඳ විඳ අපා දුක මට සැපත දුන් සරා ආදී පද්‍ය පාඨයන් තුළින් පවුල් සංස්ථාව තුළ පවතිනු ලබන ස්ත්‍රී පුරුෂ සමාජභාවය, පුරුෂ කේන්ද්‍රීය සමාජ ක්‍රමය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හා පවුල් සංස්ථාව තුළ කාන්තා වින්දිතභාවය යන සියලු සාධකයන් කැටි කරමින් ඉතා සියුම්ව පාඨකයාට ඒත්තු ගන්වා තිබේ. ඒ අනුව පෙනී යනු ලබන්නේ පවුල් සංස්ථාව තුළ කාන්තාවන් වින්දිතභාවයට පත්වන බවත් එය ස්ත්‍රී පුරුෂ සමාජභාවය නමැති සාධකය මගින් යටපත් කර ඇති බවත් වේ.

එමෙන්ම පවුල් පසුබිම් තුළ ඇතිවනු ලබන ඇතැම් ගැටලු හේතුවෙන් කාන්තාව සමාජයේ ගැරහුමට ලක්වීමද ද සිදුවනු ලබයි. එනම් ඇතැම් අවස්ථාවන් තුළදී දරු සම්පත් නොලැබීම හේතුවෙන් එහි චෝදනාව හා විවේචනය පූර්ණ වශයෙන් බිරිඳට යොමුවීම සමාජයේ දැකගත හැකි සුලභ දසුනක් වේ. මෙහිදී පුරුෂ කේන්ද්‍රීය සමාජ ක්‍රමය තුල කාන්තාවට මෙවැනි වූ චෝදනාවන් වලටද, සමාජයේ ගැරහුම් අපහාස උපහාස වලටද ලක් වීමට මෙහිදී සිදුවනු ලබයි. එමෙන්ම ස්වාමියා කෙටි කලකින් මිය ගිය හොත් එහිදී ද විවිධ අතෝරයන්ට මෙන්ම අපහාසයන්ට ලක් වීමට ද සිදු වනු ලබන්නේ පවුල් සංස්ථාව තුළ ගැහැණියට වේ. එහිදී ස්වාමියා නොමැති වීම තුළ "කණවැන්දුම් ගැහැණිය" යනුවෙන් අපහාසයන්ට ලක් වීමද, පුරුෂයා නොමැතිව තනි වීම තුළ එය අවස්තාවක් කරගනිමින් ඇගෙන් අයුතු ප්‍රයෝජන ලබාගැනීමට එනු ලබන අනිකුත් පිරිමින්ගේ අතෝරයන් වලට ලක්වීමට ද එම කාන්තාවට සිදුවනු ලබයි. ඒ අනුව ස්ත්‍රිය පවුල් සංස්ථාව තුළ විවිධ අයුරින් අසාධාරණයට හා වින්දිතභාවයට පත්වන බව මෙහිදී පෙනී යනු ලබයි.

පවුල් සංස්ථාව තුළ ස්වාමියා හා බිරිඳ එකසේ තම දායකත්වය සිය පවුල වෙත ලබාදිය යුතු වුවද ඇතැම් අවස්ථාවන් තුළ දී බිරිඳ බහු කාර්යයන් සිදු කරන ආකාරයක් දැකගත හැකිවේ. එනම් පවුලේ සියලු දෙනාගේම කටයුතු සිදු කිරීමත්, තම කටයුතු සිදුකර ගැනීමත්, නිවසෙහි එදිනෙදා කාර්යයන් සිදු කිරීමත්, පවුල හා සමාජය සම්බන්ධ කරනු ලබන ඇතැම් පොදු කටයුතු සිදු කිරීමත් යන බොහෝ කාර්යයන් සිදුකිරීමට පැවරී තිබේ. මේ හේතුවෙන් නිවස තුළ එනම් පවුල තුළ කාන්තාව ඒකාකාරී හා දැඩි අවිවේකි ජීවිතයක් ගතකරනු ලබයි. එමෙන්ම එකී වූ කාර්යයන් තුළ කුමක් හෝ අත්වැරදීමක් හා අතපසු වීමක් සිදු වුවහොත් එහි නින්දා අපහාසයන් හා ගැරහුම් ලබන්නේද කාන්තාව වේ. ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ පුරුෂයාගෙන් සිදු වනු ලබන ඇතැම් වැරදීම් සුළු අතපසුවීම් ලෙසත්, බිරිඳ ගෙන් සිදුවනු ලබන ඇතැම් අතපසුවීම් විශාල වරදක් ලෙසත් සිතීමට පුරුෂ කේන්ද්‍රීය සමාජය ක්‍රමය හුරු වී තිබේ.

එමෙන්ම ඇතැම් සමාජ ක්‍රමයන් හා උප සංස්කෘතීන් තුළ දැකගත හැකි අඩු වයස් විවාහ සෘජුවම පවුල තුළ කාන්තාවගේ ස්වාධීනත්වයට බලපෑම් ඇති කරනු ලබන තත්වයක් වේ. එනම් ශාරීරිකව ව වැඩි වියට පත් ගැහැණු දරුවකු අඩු වයසින්ම, වයසින් වැඩි පිරිමියකු සමග විවාහ කරදීම ඇතැම් සංස්කෘතීන් තුළ දැකගත හැකි සුලභ දසුනක් වේ. එහිදී කාන්තාවට තම අනාගතය පිළිබඳව, තම අධ්‍යාපනය පිළිබඳව පමණක් නොව තමන් විවාහ කරගනු ලබන පුරුෂයා පිළිබඳව ද තීරණ ගැනීමට අයිතියක් හිමි නොවනු ලබයි. ඒ අනුව එය ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුල පෙන්වාදිය හැකි කාන්තාවකගේ උච්චතම පීඩිත භාවයක් ලෙස පෙන්වා දිය හැක. එනම් තම ජීවිතය පිළිබඳව වත් තමන්ට තීරණ ගැනීමට නොහැකි වන තත්ත්වයක් කාන්තාවට උදා වී ඇති බැවිනි. එවැනි වූ පරිසරයක එම කාන්තාවට හිමි ආයාපනික අවශ්‍යතාවයන් මුළුමනින්ම අහෝසි කර දැමීමක් සිදු වනු ලබන අතර තමන්ට හිමි අධ්‍යාපනය ලැබීමේ අයිතිය ද මුළුමනින්ම උල්ලංඝනය වී යනු ලබයි. ඇතැම් පවුල් පසුබිම් තුළ වැඩිවියට පත් ගැහැණු දරුවන් ගෙදර කාර්යයන් සිදු කිරීම සඳහා යොමු කරනු ලබන අතර ඇයගේ අනෙකුත් අවශ්‍යතාවයන් පිළිබඳව අවධානයක් නොදක්වනු ලබයි. පවුල් තුළ දරුවෙකුට හිමි ඉහළම ආරක්ෂාව සැපයෙන බව සමාජය විශ්වාස කළ ද ඇතැම් සමාජ තත්ත්වයන් තුළ දරුවෙකුට විශාල වූ අතෝරයන් ප්‍රමාණයක් පවුල තුළින්ම සිදුවන බව මෙමගින් මොනවට පැහැදිලි වේ.

මේ අනුව පෙනී යන්නේ සෑම සමාජ ක්‍රමයකම මෙන්ම සෑම කුල, ආගමික හා උපසංස්කෘතියක් තුළම කාන්තාවට පවුල තුළ හිමි වී ඇති තත්ත්වය පහළ මට්ටමක පවතින බවත් පුරුෂ කේන්ද්‍රීය සමාජ ක්‍රමයක් තුළ පුරුෂයා ඉහළ තත්වයක පවතින බවත් මෙහිදී පැහැදිලි වනු ලබයි. එනම් නිදහස, අයිතිවාසිකම්, වරප්‍රසාද, ගරුත්වය ආදී වූ විවිධ සාධකයන් අඩු වැඩි වශයෙන් ස්ත්‍රිය හා පුරුෂයා තුළ පවතින බව මෙහිදී පෙන්වාදිය හැක. මෙකී වූ තත්ත්වය ඇතිවීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත ස්ත්‍රියට හා පුරුෂයාට සමාජය විසින්ම පවරා ඇති තත්ත්වයන් හා ඉඩප්‍රස්ථාවන් හේතු වන බව පෙන්වා දිය යුතුවේ. ඒ අනුව වැඩි වශයෙන් පීඩනයකට හා අසරණ භාවයකට පත් වී ඇති පවුලේ සාමාජිකයෙකු ලෙස කාන්තාව පත් වී තිබේ.

පවුල් සංස්ථාව තුළ මෙකී වූ විවිධ අතෝරයන්ට කාන්තාව මුහුණ දුන්නද පවුලක් ලෙස සමාජයේ ඉදිරියට යාම හා පැවැත්ම රඳවා ගැනීම සඳහා කාන්තාවක්ගේ භූමිකාව පවුල තුළ අත්‍යවශ්‍යම සාධකයක් වේ. එනම් පවුල තුළ ස්වාමියා මෙන්ම

බිරිඳ විසින් සිදුකරනු ලබන කාර්යයන් ද පවුලේ පැවැත්ම සඳහා බෙහෙවින් බලපානු ලබයි.

**වර්තමාන නවතාවයන්**

වර්තමානය වන විට සමාජීය මෙන්ම ආර්ථික තත්ත්වයන් හේතුවෙන් පවුල් සංස්ථාවක ආර්ථික කාර්යය දැඩි ලෙස සංකීර්ණත්වයට පත් වී ඇති අතර ඒ සඳහා පවුලක ස්වාමියාගේ මෙන්ම බිරිඳගේ දායකත්වයද අවශ්‍ය වී තිබේ. එනම් ස්ත්‍රී පුරුෂ සමාජ සමාජභාවය සතුළ ස්ත්‍රියට කෙතරම් පහත් ලෙස සැලකුවද පවුලක් ඉදිරියට යාම සඳහා ස්ත්‍රී දායකත්වය පැවතීම ඉහළ අගයක් ගනු ලබයි. අද බොහෝ විට විස්තාරිත පවුල් අහෝසි වී ඇති අතර න්‍යෂ්ටික පවුල් ක්‍රමය සුලබව දැකගත හැකි වේ. එනම් පවතින ආර්ථික, සමාජීය හා දේශපාලන ආදී බොහෝ සාධකයන් මේ සඳහා බලපා තිබේ. ඊට අමතරව නාගරීකරණය, කාර්මීකරණය මෙන්ම පෞද්ගලික බව ආදී බොහෝ හේතු සාධකයන් මෙම න්‍යෂ්ටික පවුල් සමාජය තුළ බිහි වීමට බලපා තිබේ. මෙහිදී විස්තාරිත පවුල් ක්‍රමය තුළදී මෙන් පවුලේ ශක්තිය සඳහා මෙන්ම දරුවන් රැකබලා ගැනීම සඳහා ද දෙමවුපියන් හා හිතවතුන් නොමැති මෙම න්‍යෂ්ටික පවුල තුළ බිරිඳගේ භූමිකාව අත්‍යවශ්‍යම සාධකයක් වනු ඇත. එනම් කාන්තාව එම පවුල තුළ විටෙක මවගේ භූමිකාවත්, බිරිඳගේ භූමිකාවත්, සහෝදරියකගේ භූමිකාවත් යන භූමිකා සියල්ලම සිදු කිරීමට වන බැවිනි. ඒ අනුව පවුල් සංස්ථාව තුළ කාන්තාවන් ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ විවිධ අසාධාරණයන්ට ලක්වුවද පවුලක ජීවය රඳා පැවතීමට ස්ත්‍රිය විසින් වැඩි කැපකිරීමක් සිදු කරන බව මෙහිදී මොනවට පැහැදිලි වේ.

ආදරය යනු මනෝ විද්‍යාත්මක සිද්ධාන්තයන්ට අනුව මිනිසෙකුට ජීවත් වීමට අවශ්‍ය වනු ලබන ප්‍රධානතම සාධකයක් වේ. මෙකී වූ ආදරය මුල් වතාවට පුද්ගලයෙකුට හිමිවනු ලබන්නේ පවුල් සංස්ථාව තුළින් වේ. එහිදී පවුල් සංස්ථාව තුළද ද මව මෙහි මුල් පුරුක වේ. ඒ අනුව උපන් දරුවා හට ආදරය සෙනෙහස ලබා දෙන්නේ ද එම දරුවා සමාජය වෙත හුරු කරනු ලබන සමාජානුයෝජනය සිදු කිරීමේ වගකීම දරනු ලබන්නේ ද ප්‍රධාන වශයෙන් මව වේ. ඒ අනුව පවුල තුළ හැදී වැඩී සමාජගත වන දරුවා යහපත් ගුණධර්ම වලින් යුත් පුද්ගලයෙකු බවට පත් කිරීමේ ප්‍රධානතම වගකීම මවට පැවරෙනු ලබයි. එහිදී ඇතැම් අවස්ථාවන් තුළ ස්වාමියාගේ මෙන්ම දරුවන්ගේ ද ඇතැම් අසාධාරණකම් වලට යටත් වෙමින් පවුලක සුබසිද්ධිය උදෙසා කාන්තාවන් විසින් පවුලක් තුළ බිරිඳකගේ හා මවගේ භූමිකාව සිදුකරනු ලබයි.

පවුල තුළ කායික අවශ්‍යතා, මානසික අවශ්‍යතා, භෞතික අවශ්‍යතා මෙන්ම සමාජීය අවශ්‍යතා යන පුද්ගලයාට ජීවත්වීම සඳහා අවශ්‍ය වනු ලබන සාධකයන් සපුරාදීම සිදුකල යුතුවේ. එනම් මානව පවුලක් ඉදිරියට සාර්ථකව ගමන් කරනු ලබන්නේ පවුලේ සාමාජිකයන් සඳහා මෙකී වූ අවශ්‍යතාවයන් සම්පූර්ණ වූවොත් පමණි. ඒ අනුව එකී අවශ්‍යතාවයන් සපුරා ගනිමින් පවුලක් සමාජය තුළ සාර්ථකව පැවතීම සඳහා ස්වාමි පුරුෂයාගේ දායකත්වය පමණක් ප්‍රමාණවත් නොවණ අතර බිරිඳගේ භූමිකාව ද අතිශයින් වැදගත් වෙනු ලබයි. ප්‍රජනනය, නඩත්තුව, එකට වාසය කිරීම, ආදරය, ආර්ථිකය, විනෝදය, ආරක්ෂාව, අධ්‍යාපනය හා ආගමික ක්‍රියා ආදී පවුලක් තුළ පැවතිය යුතු මෙකී වූ සාධකයන් පවුලක් තුළ කාන්තාවකගේ නියෝජනයකින් තොරව සිදු කිරීමට නොහැකි වේ. ඒ අනුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුල විවිධ වූ මතවාදයන්ට ලක් කර කාන්තාවක්ගේ භූමිකාව පිළිබඳ අඩු සැලකිල්ලක් දැක්වූවද පවුල් සංස්ථාව තුළ කාන්තාවගේ භූමිකාව නැතුවම බැරි අංගයක් වන බව මෙමගින් පැහැදිලි වනු ලබයි.

**ස්ත්‍රී භූමිකාවේ වැදගත්කම**

පවුලක් තුළ මවගේ භූමිකාව හා බිරිඳකගේ භූමිකාව නොමැති වූ විට එම පවුලේ සමබරතාවය බිඳ වැටෙන බව අමුතුවෙන් කිව යුතු කරුණක් නොවේ. ශ්‍රී ලංකාව තුළ ද වැඩි වශයෙන් කාන්තාවන් විදෙස් ශ්‍රමිකයන් ලෙස කටයුතු කිරීම සිදුවන අතර ඔහුගේ පවුල් සංස්ථාවන් විවිධ බිඳ වැටීම් වලට පත් වනු ලබයි. දරුවන්ගේ අධ්‍යාපනය, ආචාර ධර්ම මෙන්ම ආදරය හා රැකවරණය යන අංශයන් සඳහා මවගේ වැඩි දායකත්වයක් පවතිනු ලබන හෙයින් ඇතැම් අවස්තාවලදී එකී පවුල් පසුබිමක් ඇති දරුවන් සමාජ විරෝධී ක්‍රියාවන් සඳහා යොමු වීමට ද සිදුවිය හැක. එනම් එම පවුලේ පියාට ප්‍රායෝගිකව සියලු කාර්යයන් ඉටු කිරීමට නොහැකි වීම හේතුවෙන් හා කාර්යබහුලත්වය හේතුවෙන් දරුවන් පිළිබඳ පූර්ණ අවධානය යොමු කිරීමට නොහැකි වේ. එවැනි තත්ත්වයන් තුළ ළමා අපයෝජන වලට මෙන්ම ළමා අපචාර වලට ද ළමුන් යොමු වීමේ ප්‍රවණතාවය වැඩි අගයක් ගනු ලබයි. ඒ අනුව පෙනී යන්නේ මෙකී කරුණු තුළින් ද පවුලක කාන්තාවකගේ භූමිකාව අතිශය වැදගත් තැනක් ගනු ලබන බවයි.

පවුල් සංස්ථාවට පැවරෙන කාර්යයන් අතර ආර්ථික කාර්යභාරය ප්‍රධාන තැනක් ගනු ලබයි. එනම් පවුලක් සාර්ථකත්වය කරා ගෙන යාම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් ලෙස ආර්ථිකය පෙන්වාදිය හැකි අතර පවුල් සංස්ථාව තුළ ආර්ථික කළමනාකරනයේ විශේෂිත වූ භූමිකාවක් නිරූපණය කරනු ලබන්නේ බිරිඳ විසින් වේ. එනම් පවුලක එදිනෙදා කටයුතු සඳහා මුදල් කෙතරම් ප්‍රමාණයක් වැය වන්නේද, කෙතරම් මුදල් ප්‍රමාණයක් ඉතිරි කරගත හැකි වන්නේ ද යන්න පිළිබඳ මනා ආර්ථික අවබෝධයක් පවතිනු ලබන්නේ මෙම ගෘහණිය නැතිනම් බිරිඳට වේ. ඒ තුළින් මුදල් ඉතිරිකර ගැනීමටත්, සතුටුදායක මට්ටමේ ආර්ථික ක්‍රියාකාරීත්වයක් පවත්වාගෙන යාමටත් පවුල් සංස්ථාවට හැකි වනු ලබයි. ඒ අනුව නිවසක බිරිඳ නැතිනම් ගෘහණිය ප්‍රධානතම වූ කාර්යභාරයක් සිදුකරන බව මෙහිදී මොනවට පැහැදිලි වේ.

**සමාලෝචනය**

ඉහත දක්වන ලද කරුණු මගින් පැහැදිලි වනු ලබන්නේ ස්ත්‍රී පුරුෂ සමාජ භාවය තුළ කාන්තාව වැඩි වශයෙන් පීඩාවට හා වින්දිතභාවයට පත්වන ආකාරය වන අතර එය පවුල් සංස්ථාව තුළ අඩු වැඩි වශයෙන් සිදුවන බව මෙහිදී පැහැදිලි වනු ලබයි. එනම් පවුලක් තුළ කාන්තාවක් ළමා කාලයේ දී, තරුණ කාලයේදී මෙන්ම විවාහ වී බිරිඳක් හා මවක් ලෙස භූමිකාවන් ඉටු කිරීමේදී ද විවිධ ආකාරයේ අසාධාරණයන්ට ලක් වන බව මෙහිදී පැහැදිලි වනු ලබයි. නමුත් පවුල් සංස්ථාවක පැවැත්ම තහවුරු වීම සඳහා අවශ්‍ය වනු ලබන ප්‍රධානතම චරිතයයක් ලෙසත්, පවුල් සංස්ථාවක ප්‍රධානතම භූමිකාවක් උසුලනු ලබන චරිතයක් ලෙසත් මෙම කාන්තාව පෙන්වා දිය හැක. එය ඇතැම් විටක මවක, බිරිඳක හා දියණියක යන භූමිකාවන් තුළදී විවිධ ආකාරයෙන් සිදු කරනු ලබයි. ඒ අනුව පෙනී යන්නේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ පුරුෂ කේන්ද්‍රීය සමාජ ක්‍රමයක කාන්තාවට පවුල් සංස්ථාව තුළ කෙතරම් බලපෑමක් ඇති වුවද පවුල් සංස්ථාවේ පැවැත්ම සඳහා ඇයගේ භූමිකාව අත්‍යවශ්‍යම වන බවයි. ඒ අනුව පවුල් සංස්ථාව තුළ පමණක් නොව සමාජයේ සෑම අවස්ථාවකදීම සැලකිය යුතු කාර්යභාරයක් සිදු කරනු ලබන, එනම් සමාජයේ ඉහළ භූමිකාවක් දරනු ලබන කාන්තාවන් හට නිසිතැන ලබාදිය යුතු බව යතථෝක්ත සටහන පිරික්සීම තුළින් මොනවට පැහැදිලි වනු ලබයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ලියනගේ, කේ. වළාකුළුගේ, එස්. (2006). ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ස්ත්‍රීවාදය. කොළඹ: ෆෙඩ්‍රික් ඊබට් පදනම.

සමරකෝන්, මයුර. (2009). සමාජ සංස්ථා.

Herdiyanti,H.(2018).Role of Career Women in Families. *Researchgate*. Retrieved 5 October 2022, from https://www.researchgate.net/publication/329855915.

Laidmäe,V.(2015).Woman in the family: The sources of stress. *Researchgate*. Retrieved 7 October 2022, from https://www.researchgate.net/publication/309672164.